ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்ல.
**Pelawatta, Battaramulla.**

මගේ අංකය / எமது இல / My No. : 01/08/මාධ්‍ය නිවේදන -2018
ඔබේ අංකය / உமது இல / Your No. : ..............................
දිනය / திகதி / Date : 2019.03.06

දුරකථනය / தொலைபேசி / **Telephone** : 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207

අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address : www.doenets.lk / www.results.exams.gov.lk

ෆැක්ස් / பெக்ஸ் / Fax : 011-2785013

තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS : තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo

E-mail: exams@doenets.lk

---

## මාධ්‍ය නිවේදනය

## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) 2018

## නියාමන (පෙරහුරු) පරීක්ෂණය

- මාර්ගගත පරීක්ෂණයක් ලෙස මෙම විභාගයේ **නියාමන (පෙරහුරු) පරීක්ෂණය** පළමු වරට 2019.03.11 දින සිට 18 දින තෙක් දිවයින පුරා පිහිටි විභාග මධ්‍යස්ථාන 655ක දී පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු මේ වනවිට සූදානම් කොට ඇත. මෙම පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 186,097ක් පෙනී සිටීමට නියමිත වේ.
- මේ සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර මේ වනවිටත් පාසල් වෙත යවා ඇත. යම් හෙයකින් ප්‍රවේශ පත්‍ර ලැබී නොමැති නම්, අදාල පාසල මගින් විභාග දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.
- පරීක්ෂණයට පෙනී සිටීමේ දී අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විභාග ප්‍රවේශ පත්‍රය සමඟ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කළ යුතු ය.
- අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් හට පමණක් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිටීමට හැකියාව ලැබෙන අතර තමාට ලැබී ඇති ප්‍රවේශ පත්‍රයේ නියමිත දින දී නියමිත වේලාවට පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු බව අවධාරණය කෙරේ.
- විභාග පරිපාලන කටයුතු සඳහා කාර්ය මණ්ඩල මේ වනවිටත් පත් කර ඇති අතර මේ සඳහා සම්බන්ධීකරණ මධ්‍යස්ථාන 173ක් සහ විභාග අධීක්ෂණ කණ්ඩායම් අවශ්‍ය කටයුතු සඳහා සූදානම් කොට ඇත.

**අපේක්ෂකයින් සඳහා උපදෙස්**

(1) මෙය දිනකට සැසි 02ක් ලෙස දින 08ක දී පැවැත් වේ.
(2) කල්වේලා ඇතුව විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතු ය.
(3) විභාග අපේක්ෂකයන් තමාට අදාළ විභාග අංකය, මාධ්‍යය නිවැරදි දැයි පරීක්ෂා කළ යුතු වේ.
(4) මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත ය. ප්‍රශ්න පත්‍ර දෙක ම සඳහා නියමිත කාලය පැය තුනකි. ප්‍රවේශ කාලය (Loading Time)සඳහා අමතර විනාඩි දහයක කාලයක් ලබා දේ.
   - I පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත බහුවරණ ප්‍රශ්න පත්‍රයක් වන අතර මාර්ගගත ක්‍රමයට (Online) නිවැරදි පිළිතුරු සළකුණු කළ යුතු ය.
   - II පත්‍රය ප්‍රායෝගික ප්‍රශ්න 07කින් සමන්විත වන අතර සියලු ම ප්‍රශ්නවලට මාර්ගගත ක්‍රමයට (Online) පිළිතුරු සැපයිය යුතු ය.

(5) පිළිතුරු සැපයීමේ දී ලබා දී ඇති උපදෙස් පිළිපදින්න.

- පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් Smart අත් ඔරලෝසු, ජංගම දුරකතන සහ විද්‍යුත් උපකරණ මගින් විභාග වංචා සිදු කරන්නේ ද යන්න පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලෙස විභාග ශාලාධිපතිවරුන් දැනුවත් කොට ඇත. එවැනි වංචා සිදු කරන අයදුම්කරුවන්ට වසර 5කට විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන සියලු ම විභාග සඳහා පෙනී සිටීමට තහනමක් පනවනු ලබන අතර මෙවර විභාගයේ ප්‍රතිඵල ද අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.
- විභාග මධ්‍යස්ථාන තුළට අදාල පාසලේ ගුරුවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු අවසර නොමැති කිසිදු පුද්ගලයෙකු ඇතුළු වීම තහනම් වේ. විභාග කටයුතුවලට බාධාවන අයුරින් කටයුතු කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පොලිස් මූලස්ථානය වෙත දන්වා ඇත.
- මෙම පරීක්ෂණය සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකතන අංක ඇමතීමට කටයුතු කරන්න.

ක්ෂණික ඇමතුම් අංකය : 1911
පාසල් විභාග සංවිධාන ශාඛාව : 0112784208/0112784537/0113188350/0113140314

**බී. සනත් පූජිත**
විභාග කොමසාරිස් ජනරාල්